විද්‍යාලය : ර/ ඇඹිලිපොල ශ්‍රී මහින්ද මහා විද්‍යාලය
සිංහල භාෂාව හා සාහිත්‍යය : 13 ශ්‍රේණිය පැවරුම්
විෂය භාර ගුරු : ඊ.ජී.එස්.එච්. ඇතුල්දූර
නිර්දේශිත ග්‍රන්ථය : **නූතන පද්‍ය සංග්‍රහය**

**ප්‍රශ්නය : කොළඹ යුගයේ දෙවන පරපුරට අයත් කවීන්, සොබා දහමේ සෞන්දර්යය කලාත්මක ලෙස ප්‍රතිනිර්මාණයෙහි ලා දක් වූ සමත්කම නූතන පද්‍ය සංග්‍රහයේ එන පද්‍ය පන්ති තුනකින් නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න.**

**පිළිතුර සඳහා මග පෙන්වීම :**

- **සොබා සිරිය, සමාජ අසාධාරණය, ප්‍රේමය, ගැමි දිවිය, කතා පුවත් කවියට නැඟීම කොළඹ යුගයේ දෙවන පරපුරට අයත් කවීන්ගේ නිර්මාණවල වස්තු විෂය විය.**
- **මීමන ප්‍රේමතිලක - අඩ සඳ**
  **විමලරත්න කුමාරගම - වන්නියේ සැන්දෑව**
  **එච්.එම්. කුඩලිගම - තවමත් ඔබ මගේය**
- **සොබා දහමේ පවත්නා දේවල් හා සිදුවීම් එකිනෙක ගළපා ජීවිත අවස්ථා හා බද්ධ කරමින් ස්වභාව සෞන්දර්යයේ අපූර්වත්වය උක්ත කාව්‍ය නිර්මාණවල අන්තර්ගත විය.**
- **මෙකී නිර්මාණවල කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ භාෂාවේ මට සිලිටිබවයි. සරලත්වයයි.**
- **කලාත්මක යනු නව්‍යබවයි. අලුත් ආකාරයෙන් සිතා නව නිර්මාණ බිහිකිරීමයි.**
- **උක්ත අදහස් ඉදිරිපත් වන පරිදි නිර්ව්‍යාජ අත්දැකීම්වල ඇති රසවත්භාවය නොසිඳී උල්පතකින් ගලනා ජලය මෙන් කවි සංකල්පනා නගමින් ජන සමාජය පුබුදු කරන්නට කවියා උත්සුක වී ඇති අයුරු තහවුරු කරමින් පිළිතුර ලියන්න.**